00059

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන - හයවන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2015**

**ප්‍රාථමික අධ්‍යාපනය – ESU4117**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2015 අප්‍රේල් 08** **වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. "අනිවාර්ය අධ්‍යාපනය" යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. සහභාගිත්වය සඳහා ළමා අයිතිය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ගුරු කේන්ද්‍රිය අධ්‍යාපනය ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනයෙන් වෙනස් වන අයුරු නිදසුන් දෙකක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ප්‍රාථමික අධ්‍යාපනය නිපුණතා පාදක අධ්‍යාපනයකි. විමසන්න.

05. 'අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා' සහ 'අභිමත ඉගෙනුම් නිපුණතා' අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ප්‍රාථමික පාසල් දරුවාගේ පෞරුෂ සංවර්ධනය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

07. 'ප්‍රාථමික අවධියේ දරුවන්ගේ සාධනය ඇගයීම සඳහා විධිමත් ඇගයීම් ක්‍රම නුසුදුසුය." මෙම ප්‍රකාශයට එකඟව හෝ එරෙහිව අදහස් දක්වන්න.

08. විෂයමාලා කළමනාකරුවකු ලෙස ප්‍රාථමික ගුරුවරයාගේ භූමිකාව කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) සම්පත් පුද්ගලයකු ලෙස පාසලේ විදුහල්පති භූමිකාව ප්‍රාථමික අධ්‍යාපනයට වැදගත් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ප්‍රජා සහය ලබා ගැනීමට විදුහල්පතිවරයා කටයුතු කළයුතු ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව සකස් කිරීමේදී සැළකිල්ලට ගත් ජාතික පොදු නිපුණතා හත (07) නම් කරන්න. (ලකුණු 07)

(ii) තෝරා ගත් එක් නිපුණතාවක් පැහැදිලි කර එය ඉටුකර ගැනීමට ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව තුළ සැලසුම් කර ඇති ඉගෙනුම් අවස්ථා තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 13)

11. (i) ප්‍රාථමික අධ්‍යාපනයේ 'සමෝධානිත ප්‍රවේශය' යන්නෙන් කුමක් අදහස් වන්නේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ඔබ කැමති ශ්‍රේණියක පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයට අදාළව ඕනෑම තේමාවක් තෝරාගෙන එහි සමෝධානිත ප්‍රවේශය යොදා ගෙන ඇති අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 12)

12. (i) ප්‍රාථමික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දි අවිධිමත් තක්සේරුකරණය යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) අවිධිමත් තක්සේරුකරණ ක්‍රම තුනක් (03) දක්වා, ඒවා නිදසුන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 09)

(iii) අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවිධිමත් තක්සේරුකරණ ක්‍රම භාවිත කළ හැකි අයුරු නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

13\. (i) "සැමට අධ්‍යාපනය" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) නිදහසින් පසු සැමට ප්‍රාථමික අධ්‍යාපනය සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර දක්වන්න. (ලකුණු 06)

(iii) අද අපගේ පාසල් පද්ධතිය තුල මෙම සංකල්පය ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව ඔබගේ අදහස් විවේචනාත්මක ලෙස ඉදිරිපත් කරන්න.

(ලකුණු 08)

14\. පහත සඳහන් මාතෘකා දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ප්‍රාථමික අධ්‍යාපනය සඳහා දාර්ශනික මතවාදවල බලපෑම

(ii) ආරක්ෂාව සඳහා ළමා අයිතිය

(iii) සෙල්ලම් මිදුල සහ ප්‍රීතිමත් ඉගෙනුම

(iv) 1 ශ්‍රේණියට ඇතුලත් වන සිසුන්ගේ ප්‍රවේශ නිපුණතා හඳුනාගැනීම

හිමිකම් ඇවිරිණි.